## ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනය - 2013

-------------------------------------------

ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1993 අංක 47 දරන ක්‍රීඩා (සංශෝධිත) පනතේ 9 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මෙම විගණනය ක්‍රියාත්මක කිරීමේදී, මා විසින් පරිචයෙහි යෙදෙන වරලත් ගණකාධිකාරි සමාගමක සහාය ලබාගන්නා ලදි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සම්මේලනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු වල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකානශවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය මතය සඳහා පදනම

---------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කෙරෙන කරුණු පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ විස්තර කර ඇති කරුණු වලට යටත්ව ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්ම වලට අනුකූල වන බව මාගේ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ දෝෂ

-----------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මෙම වාර්තාවේ දිනය දක්වා ශ්‍රී ලංකා දැල්පන්දු සම්මේලනයේ 2011 සහ 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නැත. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී වත්කම් හා වගකීම් වල පැවති ආරම්භක ශේෂ ඒකාබද්ධ කළ නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී රාජ්‍ය බැංකුවක විවෘත කරන ලද ඉතිරිකිරීමේ ගිණුමේ ආරම්භක ශේෂය සම්මේලනයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

(ඇ) පෙර වර්ෂයේදී රාජ්‍ය බැංකුවක විවෘත කරන ලද ජංගම ගිණුමේ ගනුදෙනු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි.

#### 2.2.2 විගණනයට ඉදිරිපත් නොවූ සාක්ෂි

---------------------------------------

පහත සඳහන් අයිතම ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| අයිතමය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| අ) ආදායම් | 265,186 | බැංකු ප්‍රකාශන, තැන්පතු පත්‍රිකා, ගෙවීම් වවුචර් සහ ජංගම ගිණුම් අංක 0350784ට අදාල චෙක්පත්වල උප පත්‍රිකා |
| ආ) වියදම්/ගෙවීම් | 884,162 | |
| ඇ)ඉතිරි කිරීමේ ගිණුමේ ශේෂය | 17,044 | ඉතිරිකිරීමේ ගිණුමේ විස්තර |

## 3. අයවැය පාලනය

------------------

සම්මේලනය විසින් 2013 වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයේ දුර්වලතාවයන් විටින් විට සම්මේලනයේ කළමනාකරණයට අවධානය සඳහා යොමුකර ඇත. එහිදී පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ.

අ) ගිණුම්කරණය

ආ) අයවැය පාලනය